# මුදල් අමාත්‍යාංශය
# நிதி அமைச்சு
# MINISTRY OF FINANCE

මහලේකම් කාර්යාලය, කොළඹ 01. ශ්‍රී ලංකාව
செயலகம், கொழும்பு 01. இலங்கை
The Secretariat, Colombo 01. Sri Lanka

කාර්යාලය / அலுவலகம் / Office: (94)-11-2484500, (94)-11-2484600, (94)-11-2484700
ෆැක්ස් / பெக்ஸ் / Fax: (94)-11-2449823
වෙබ් අඩවිය / வெப் சைட் / Website: www.treasury.gov.lk


මගේ අංකය / எனது இல. / My No.: BD/CBP/01/01/02 - 2021
ඔබේ අංකය / உமது இல. / Your No.:
දිනය / திகதி / Date: 2021.12. 21

**අයවැය චක්‍රලේඛ අංක: 03/2021**

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්
රාජ්‍ය අමාත්‍යාංශවල ලේකම්වරුන්
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්/දිස්ත්‍රික් ලේකම්වරුන්
රාජ්‍ය සංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන්

**<u>2022 වර්ෂය තුළ වියදම් දැරීම සඳහා බලය දීම හා රාජ්‍ය වියදම් කළමනාකරණය</u>**

2022 මුදල් වර්ෂයේ වියදම් ඇස්තමේන්තු ඇතුළත් 2021 අංක 30 දරන විසර්ජන පනත 2021 දෙසැම්බර් 10 දින පාර්ලිමේන්තුවේ සම්මත වී තිබේ. 2022 වර්ෂය තුල එම පනත අනුව වියදම් දැරීමේදී අදාල කරගත යුතු මාර්ගොපදේශයන් මෙම චක්‍රලේඛයේ අඩංගු වේ.

**02.** ඒ අනුව, 2021 අංක 30 දරන විසර්ජන පනතේ සහ 2022 වාර්ෂික ඇස්තමේන්තුවල දැක්වෙන සීමාවන් ඉක්ම නොයන සේ ස්වකීය ආයතනවල වියදම් දැරීම සහ බැඳීම්වලට එළැඹීමට ප්‍රධාන ගණන්දීමේ නිළධාරීන්, ගණන් දීමේ නිළධාරීන් හා වියදම් සම්බන්ධයෙන් කටයුතු කරන නිළධාරීන් බැඳී සිටී.

### 03. කාර්තුමය වශයෙන් වියදම් දැරීම සඳහා අධිකාරී බලය

2022 වර්ෂය සඳහා ඒකාබද්ධ අරමුදලෙන් මුදල් ඉවත්කර ගැනීම සම්බන්ධයෙන් වන වොරන්ට් බලපත්‍ර නිකුත් කිරීම කාර්තුමය පදනමින් සිදු කිරීමට තීරණය කර ඇති අතර ඒ සම්බන්ධයෙන් නිකුත් කරන ලද අංක 02/2021 දරන ජාතික අයවැය චක්‍රලේඛයට අනුකූලව එක් එක් වැය දරන ආයතනවල කාර්තුමය වියදම් සැලසුම් කරගත යුතු ය. එම වියදම් සැලැස්මට අනුව භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් අක් මුදල් නිදහස් කිරීමට කටයුතු කරනු ඇත. ඒ සඳහා බලය ලබාදෙමින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 150 (1) අනු ව්‍යවස්ථාවේ විධිවිධානවලට අනුකූලව, 2021 අංක 30 දරන විසර්ජන පනත පරිදි 2022 පළමු කාර්තුවේ වියදම් දැරීමට හැකිවන පරිදි අදාළ අධිකාරී බලපත්‍ර මුදල් අමාත්‍යතුමා විසින් අත්සන් තබා ඇත.

ඒ අනුව, 2022 ජනවාරි මස 01 දින සිට මාර්තු 31 දක්වා වන පළමු කාර්තුව තුළ ගෙවීම් වවුචර්පත් හා වෙනත් ලියවිලි මත පහත සඳහන් පරිදි අදාළ අධිකාරිය සටහන් කළ යුතු වේ.

| | | |
|---|---|---|
| (අ) සාමාන්‍ය පොදු සේවා සඳහා | - | 2022 අංක 1 දරන සාමාන්‍ය වොරන්ට් බලපත්‍රය |
| (ආ) විශේෂ නීති සේවා සඳහා | - | 2022 අංක 1 දරන විශේෂ නීති අධිකාරී බලපත්‍රය |
| (ඇ) අත්තිකාරම් ගිණුම් කටයුතු සඳහා | - | 2022 අංක 1 දරන අත්තිකාරම් බලපත්‍රය |

## 04. රාජ්‍ය වියදම් කළමනාකරණය

මුදල් රෙගුලාසි 127 අනුව සියලුම ප්‍රධාන ගණන් දීමේ නිලධාරීන් විසින් තමා යටතේ වන ආයතනවල මූල්‍ය පරිපාලනයේ ප්‍රමාණවත් බව තහවුරු කිරීම සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයාට වගකිව යුතු වේ. එමෙන්ම, 2022 වර්ෂයට අදාල විස්තරාත්මක අයවැය ඇස්තමේන්තු ප්‍රකාශනවලද අවධාරණය කර ඇති පරිදි විසර්ජන පනතේ සීමාවන් නොඉක්මවන පරිදි වියදම් කළමනාකරණය කර ගැනීම ප්‍රධාන ගණන් දීමේ නිලධාරීන්ගේ මෙන්ම ගණන් දීමේ නිලධාරීන්ගේ ද වගකීම බව තරයේ අවධාරණය කරමි.

2022 වර්ෂයේදී රාජ්‍ය මූල්‍ය කළමනාකරණය අභියෝගාත්මක තත්වයක පවතින බැවින් වියදම් පාලනය සම්බන්ධයෙන් මනා අධීක්ෂණයක් පවත්වා ගත යුතු වේ. ඒ අනුව, පහත සඳහන් කරුණු පිළිබඳව අවධානය යොමු කිරීම අපේක්ෂා කරමි.

**04.1** මුදල් අමාත්‍යවරයා විසින් 2022 අයවැය කථාවේදී යෝජනා කරන ලද පරිදි වියදම් පාලනය සම්බන්ධයෙන් වූ පහත සඳහන් යෝජනා ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පියවර ගත යුතුය.

i. ඒකාබද්ධ අරමුදලින් ඉන්ධන දීමනා ගෙවනු ලබන ගරු අමාත්‍යවරුන්/පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් හා සියළු රාජ්‍ය නිලධාරීන් වෙත ගෙවනු ලබන ඉන්ධන දීමනාවෙන් මසකට ලීටර් 5 ක් හෝ ඒ සමාන මුදල් ප්‍රමාණයක් අඩු කිරීම
ii. රාජ්‍ය ආයතනවල දුරකථන වියදම සියයට 25 කින් අඩු කිරීම සඳහා අවශ්‍ය කටයුතු කිරීම
iii. විදුලිබල වියදම සියයට 10 කින් අඩු කිරීම සඳහා ක්‍රමවේද සකස් කිරීම
iv. දැනට ඉදිවෙමින් පවතින කාර්යාල ගොඩනැගිලි හැර නව කාර්යාල ඉදිකිරීම අයවැය යෝජනා මගින් යෝජිත පරිදි වසර දෙකක කාලයකට අත්හිටුවීම.
v. 2022 වර්ෂයතුල රජයේ ආයතන සඳහා වාහන මිලදී ගැනීම අත්හිටුවීම (එසේ වුවත් පොදු සේවාවන් හා සංවර්ධන කටයුතු සඳහා අවශ්‍ය අත්‍යවශ්‍ය උපයෝගීතා හා ඉඩම්, වාහන මිළදී ගැනීම අවස්ථාවෝචිතව සලකා බලනු ඇත).
vi. ආයතනයේ මනා පැවැත්ම සඳහා අත්‍යවශ්‍යවන තනතුරුවල පුරප්පාඩු පිරවීම සඳහා හැර ඒකාබද්ධ අරමුදලෙන් වියදම් දරන්නට වන ආයතන සඳහා නව කාර්ය මණ්ඩල බඳවා ගැනීම අත්හිටුවීම.

**04.2** මීට අමතරව පහත සඳහන් වියදම් පාලන ක්‍රමවේද තවදුරටත් ක්‍රියාත්මක කළ යුතු ය

i. ඒකාබද්ධ අරමුදලේ මුදල් යොදාගනිමින් 2022 වර්ෂය සඳහා කැලැන්ඩර්, දිනපොත්, සටහන් පොත් මුද්‍රණය නොකළ යුතු ය.
ii. නව ගොඩනැගිලි කුලියට ගැනීම නොකළ යුතු අතර ප්‍රතිපාදන නොමැතිව ලබාගන්නා ගොඩනැගිලි සඳහා කුළී ගෙවීමට පසුව අමතර ප්‍රතිපාදන ලබානොදෙනු ඇත.
iii. දේශීය අරමුදල් භාවිතා කරමින් විදේශ අධ්‍යන චාරිකා සංවිධානය නො කළ යුතු අතර ශ්‍රී ලංකාව වෙනුවෙන් යම් නිල/රාජ්‍යමය නිශ්චිත සහභාගීත්වයක් අත්‍යවශ්‍ය නො වන්නේ නම් දේශීය අරමුදල් මගින් වියදම් දරමින් සම්මන්ත්‍රණ/ වැඩමුළු ආදිය සඳහා නිලධාරීන් සහභාගි නො කළ යුතු ය.
iv. නිසි අධිකාරී බලයක් නොමැතිව අමාත්‍යාංශ හෝ ආයතන මට්ටමින් නිකුත් කරනු ලබන අභ්‍යන්තර උපදෙස් මත දීමනා ගෙවීම සඳහා මෙම අධිකාරී බලය යොදා නොගත යුතුය.

**04.3** වියදම් පාලනය සම්බන්ධයෙන් මින්පෙර නිකුත් කර ඇති අංක 05/2019 හා 07/2019 දරන අයවැය චක්‍රලේඛ මෙම චක්‍රලේඛය මගින් අහෝසි කරනු ලැබේ.

**04.4** දැනට කෙරීගෙන යන ව්‍යාපෘති වැඩවලට අදාල අතැති හෝ නිරවුල් කල යුතු බිල්පත් සඳහා ගෙවීම් කිරීමට ප්‍රතිපාදන වෙන් නොකර නව කාර්යයන් ආරම්භ නොකළ යුතු ය

**04.5** 2021.12.06 දිනැති කාර්තුමය වොරන්ට් බලපත්‍ර නිකුත් කිරීම හා බැඳීම් කළමනාකරණය පිළිබඳ අයවැය චක්‍රලේඛ අංක 2/2021 හි උපදෙස් ද 2022 වියදම් දැරීමේදී අදාල කරගත යුතු ය.

**04.6** අයවැයෙන් වාර්ෂිකව මූල්‍යනය නොවන වාණිජමය ස්වරූපයේ රාජ්‍ය ආයතන ස්වකීය වියදම් පියවා ගැනීම සඳහා හැකි සෑම පියවරක්ම ගත යුතු අතර ආදායම් ඌණතාවය සලකා භාණ්ඩාගාරයෙන් ප්‍රතිපාදන ලබාදෙන මෙන් ඉල්ලීම් නොකළ යුතුය. අයවැයෙන් මූල්‍යනය වන රාජ්‍ය ආයතන ඔවුන් වෙත සලසා ඇති ප්‍රතිපාදන සීමා මත බැඳීම් කළමනාකරණය කරගත යුතු ය. දැනට දී ඇති ප්‍රතිපාදන සීමාතුල පමණක් අක්මුදල් නිදහස් කරනු ලබන අතර ප්‍රාග්ධන වියදම් සම්බන්ධයෙන් ලබා ගත යුතු පූර්ව අනුමැතීන් නොපමාව ලබා ගැනීමට කටයුතු කල යුතුය.

**04.7** මෙම සීමාවන් හේතුවෙන් විදේශ මූල්‍යනය මත ක්‍රියාත්මක වන ව්‍යාපෘති වල අඛණ්ඩ ක්‍රියාකාරිත්වයට බාධා නොවන පරිදි සැලසුම් සකස් කරගත යුතුය. එම සංවර්ධන ව්‍යාපෘති වල කාර්ය සාධනයට බාධාවන යම් යම් සීමාවන් වේ නම් ප්‍රධාන ගණන්දීමේ නිළධාරීන් විසින් නොපමාව භාණ්ඩාගාරය දැනුවත් කර අවශ්‍ය උපදෙස් ලබා ගත යුතුය.

## 05. <u>2022 වර්ෂය සඳහා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම</u>

රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 2/2020 හි 03 හා 04 ඡේදවල දැක්වෙන පරිදි වාර්ෂික අයවැය ප්‍රතිපාදන උපයෝජනය වන ආකාරය ද සඳහන් කරමින් 2022 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම හා ප්‍රසම්පාදන සැලැස්ම සකස් කර අදාළ පරිදි අනුමැතිය ලබා ගත යුතු වේ.
2022 වර්ෂය තුල මුදල් නිදහස් කිරීම කාර්තුමය සීමාවන්ට අනුව සිදුකරන බැවින්, ජාතික අයවැය චක්‍රලේඛ 02/2021 හි විධිවිදාන වලට ද අනුකූළව එම කාර්තුමය ප්‍රතිපාදන සීමාවන් ද සැලකිල්ලට ගෙන වාර්ෂික ක්‍රියාකාරී සැලසුම් සකස් කළ යුතු වේ.

## 06. <u>අයවැය යෝජනා</u>

2022 අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීම පිළිබඳ භාණ්ඩාගාර ලේකම්ගේ අංක MF/NP/Gen/2020/01 හා 2021.11.23 දිනැති ලිපිය මගින් දැනටමත් උපදෙස් දී ඇති බැවින් ඒ අනුව කටයුතු කළ යුතු වේ.

නව වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට පෙර දැනටමත් නියමිත අනුමැතිය ලබාගෙන ඇති, 2022 ඇස්තමේන්තු තුල ප්‍රතිපාදන ඇතුලත්ව ඇති වැඩ සටහන් සඳහා ප්‍රතිපාදන ඌනතාවයක් පවතී නම් ඒ කෙරෙහි අදාල ප්‍රතිපාදන යොදා ගැනීමේ හැකියාව සොයා බැලිය යුතුය.

## 07. <u>අමතර ප්‍රතිපාදන ඉල්ලීම්</u>

2021 අංක 30 දරන විසර්ජන පනතේ 6 (1) වගන්තියේ සඳහන් පරිදි 2022 මුදල් වර්ෂය තුළ නව වැඩසටහන් හා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම පිණිස අමාත්‍යංශ, දෙපාර්තමේන්තු හෝ රජයේ ආයතන විසින් අතිරේක ප්‍රතිපාදන ඉල්ලුම් නොකල යුතු ය.

## 08. <u>මු. රෙ. 66 සහ 69 යටතේ ප්‍රතිපාදන මාරු කිරීම්</u>

පළමු කාර්තුවේදී මෙම විධිවිධාන යටතේ ප්‍රතිපාදන මාරු කිරීමට අවසර දෙනු නොලැබේ. සුවිශේෂී හේතු මත පමණක් මුදල් රෙගුලාසි 66 හා 69 යටතේ ප්‍රතිපාදන මාරු කිරීම 2022 සමස්ථ මූල්‍ය වර්ෂය සළකා බලා කළ යුතුය. එහිදී මුදල් රෙගුලාසි 65(4) හි දැක්වෙන සීමා කිරීම් වලට යටත්ව ප්‍රතිපාදන මාරු කල යුතු අතර සෑම විටම ප්‍රතිපාදන <u>ඌණතාවයට හා ඉතිරිවීමට පැහැදිලි හේතු දැක්වීමක් කළ යුතු ය</u>.

## 09. <u>අත්තිකාරම් ගිණුම් කටයුතු</u>

එක් එක් කාර්තුව තුළදී ගෙවීමට සිදුවන අත්තිකාරම් (උදා: විශේෂ අත්තිකාරම් - පළමු කාර්තුව, උත්සව අත්තිකාරම් - දෙවන කාර්තුව) පිළිබඳ අවධානය යොමුකර අනුමත සීමාවන් තුළ අත්තිකාරම් ගිණුම් කටයුතු කාර්තුමය වශයෙන් සැලසුම් කර ගත යුතු ය.

අත්තිකාරම් ගිණුම් කටයුතු සඳහා උපරිම වියදම් සීමාව වැඩි කිරීමට අවසර නොදෙන බව අවධාරණය කරන අතර කාලීනව අවශ්‍ය සමාලෝචනයන් කර, අනුමත වාර්ෂික සීමාවන් තුල කටයුතු සිදුවන බවට අදාල නිළධාරීන් විසින් තහවුරු කරගත යුතුය.

**10.** **<u>පැහැදිලි කර ගැනීම</u>**

මෙම චක්‍රලේඛය සම්බන්ධයෙන් කිසියම් පැහැදිලි කිරීමක් අවශ්‍ය වන්නේ නම්, ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ ඔබ අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව/ ආයතනය පිලිබඳ වගකීම දරන අදාල නිලධාරියා සම්බන්ධ කර ගැනීමට කටයුතු කල යුතුය.

**එස්.ආර්.ආටිගල**
භාණ්ඩාගාර ලේකම්

පිටපත් :

1. ජනාධිපති ලේකම්
2. අග්‍රාමාත්‍ය ලේකම්
3. අමාත්‍ය මණ්ඩලයේ ලේකම්
4. විගණකාධිපති
5. ලේකම්, මුදල් කොමිෂන් සභාව